**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය - 2016**

**--------------------------------------------------**

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ(3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

---

(i) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයට අදාළව ක්ෂය වියදම රු.1,982,364ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු. 1,763,470ක් ලෙස දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි ගිණුමෙන් ගොඩනැගිලි අළුත්වැඩියා ගිණුමට මාරු කළ රු.1,801,671 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.2,020,565 ක් ලෙස දක්වා තිබූ අතර එම ගැලපීම මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයේ මූල්‍ය නොවන වෙනස්වීම් යටතේ දැක්විය යුතු වුවත් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් ලෙස දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී කපා හරින ලද ලැබිය යුතු එකතු කළ අගය මත බද්ද රු.447,303 ක ශේෂය මූල්‍ය නොවන වෙනස්වීම් යටතේ දැක්විය යුතු වුවත් එය මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

---

අයකිරීමක් නැතිව හෝ නාමික අයකිරීමක් සහිතව බෙදාහැරීම සඳහා තිබෙන තොග ඒවායේ පිරිවැය සහ වත්මන් ප්‍රතිසම්පාදන අගය යන දෙකින් අඩු අගයට මැනිය යුතුවුවද කාර්යාංශය විසින් මුදල් අයකිරීමකින් තොරව බෙදාහැරීම පිණිස තබා ඇති රු. 345,252 වටිනා ප්‍රවර්ධන අයිතම සම්බන්ධයෙන් එකී උපදෙස් අනුගමනය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය වෙනුවෙන් ලැබූ ස්ථාවර තැන්පතු පොලිය රු.54,478 ක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දැක්වීම හා 2016 වර්ෂයට අදාළව ලැබිය යුතු පොලිය රු.79,998 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස, ගිණුම්වල නොදැක්වීම හේතුවෙන් එකතුව රු.25,520 ක පොලී ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කළ යුතු ප්‍රවර්ධන අයිතම අවසන් තොගයෙන් පිරිවැය රු.1,358,488 ක් වූ තොගයක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණු අතර රු.345,252 ක් ලෙස ඇතුළත් කර තිබූ තොගයද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන් යටතේ දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී වැරදීමකින් ප්‍රාග්ධනිත කර තිබුණු ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා දරන ලද වියදම් රු.1,801,671 ක් නිවැරදි කිරීමේදී පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස රඳවාගත් ලාභයට ගැලපිය යුතු වුවත් එය සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2015 හා 2016 වර්ෂ සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් වෙන් කිරීම් සිදුකර නොතිබූ අතර 2014 වර්ෂයේ විගණන ගාස්තු සඳහා ගෙවා තිබුණු රු.198,375 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් ගිණුම හා සේවක අර්ථ සාධක අරමුදල් වියදම් ගිණුම රු.58,272 කින් හා සේවක භාරකාර අරමුදල් වියදම් ගිණුම හා ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් ගිණුම රු.11,652 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------------

පිරිවැය රු. 5,638,960 ක් වූ දේපල පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනද එකතුව රු.8,363,700 ක්වූ වෙළඳ හා ප්‍රවර්ධන වියදම්වලට අදාළ බිල්පත්වල මුල් පිටපත් හා මුදල් ලද පාර්ශවයේ සනාථ කිරීම් ද විගණනයට ඉදිරිපත් නොවීය.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

---------------------------------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දීර්ඝ කාලීන ආයෝජන ලෙස රු.26,648,658 ක් දක්වා තිබුණද බැංකු නිවේදන ( Renewal Notice ) අනුව එම ශේෂය රු.27,898,647ක් වූයෙන් රු.1,249,989 ක වෙනසක් නිරීක්ෂණය විය.

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය රු.30,895,865 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,407,006 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,488,859 කින් වර්ධනය වී තිබුණි. වෙළඳ වියදම් රු.25,441,814 කින් වැඩි වී තිබුණද ආදායම රු.30,636,495 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.21,704,200 ක් වූ අතිරික්තය උච්චාවචනය වෙමින් 2016 දී රු.30,895,865 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 29,522,428 ක් වූ කාර්යාංශයේ දායකත්වය විචලනයන් සහිතව වර්ධනය වී 2016 වර්ෂයේදී රු.44,697,026 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 42(2) වගන්තිය අනුව කාර්යාංශයේ පරමාර්ථ පහත පරිදි වේ.

(i) ශ්‍රී ලංකාව ජාත්‍යන්තර කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම් හා ප්‍රදර්ශන පැවැත්වෙන ස්ථානයක් ලෙස සහ පොළඹවන සුළු චාරිකා ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.

(ii) ජාත්‍යන්තර කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ ප්‍රදර්ශන පැවැත්වෙන ස්ථානයක් වශයෙන් හා පොළඹවන සුළු චාරිකා ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සම්බන්ධීකරණයෙන් හා සහයෝගීතාවෙන් සංවර්ධනය කිරීම සහ සංචාරක වෙළඳපලෙහි ශ්‍රී ලංකාව පිළිබඳ අලෙවිකරණ කටයුතු සිදුකිරීමට වගබලා ගැනීම සඳහා සැලසුම්කළ පොදු ප්‍රතිපත්තියක් ඇති කර ගැනීම.

(iii) ජාත්‍යන්තර කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සම්බන්ධීකරණය කිරීම හා ඊට සහාය දීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශ මඟින් ඒ සඳහා සේවා සැපයීම.

(iv) සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන සාර්ථකව පැවැත්වීම සහ පොළඹවන සුළු චාරිකාවැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සහ විදේශීය සම්මේලන ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සංවිධානයන් සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගීතාව පවත්වා ගැනීම.

(v) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා වැඩසටහන්වල විවිධ අංශවල නිරතව සිටින තැනැත්තන්ට සහ සංවිධානවලට වෘත්තීමය ප්‍රමිති නියම කිරීම සහ එම ප්‍රමිති පවත්වාගැනීම බලාත්මක කිරීම.

(vi) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා පිළිබඳ විවිධ අංශවල කටයුතු කිරීමෙහි නියැලී සිටින විවිධ ගණවල තැනැත්තන්ගේ හෝ සංවිධානවල වෘත්තීය නිපුණතා සංවර්ධනය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(vii) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සංවර්ධනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ නිරතව සිටින යම් සමාගම් හෝ සංවිධාන සමඟ අනුබද්ධ වීම, ඒවායේ සාමාජිකත්වය ලබා ගැනීම හෝ ඒ යම් සංගම් හෝ සංවිධාන ගිවිසුම්වලට ඇතුළත්වීම.

(viii) ශ්‍රී ලංකාවෙහි මෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපොලෙහි අළෙවි කිරීම සඳහා කාර්යාංශයට මගපෙන්වීම ලබාදීම.

(ix) සත්කාරක සේවා ඇතුලුව ප්‍රමාණවත්, ආකර්ශනීය සහ කාර්යක්ෂම සංචාරක සේවා, අඛණ්ඩව පවත්වාගෙන යා හැකි ආකාරයට සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(x) කාර්යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අනුෂාංගික හෝ හිතකර සියළු ක්‍රියා සහ දේ ශ්‍රී ලංකාවේ හෝ අන් ස්ථානවල සිදුකිරීම.

ආයතනයේ අරමුණු ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉහත අරමුණු අතරින් (ii), (v) , (vi) , (vii) ,(viii) සහ (ix) යන අරමුණු හා පරමාර්ථ මෙතෙක් ඉටුකරගැනීමට නොහැකිව තිබුණි.

(ආ) වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් 14 ක් සඳහා රු.මිලියන 212.85 ක් වෙන්කර තිබූ නමුත් වර්ෂය තුළ උපයෝජනය කර තිබුණේ රු.මිලියන 104.14 ක් පමණි. එනම් සියයට 49 ක ප්‍රතිශතයකි.

(ඇ) වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව 2016 වර්ෂයේදී ව්‍යාපෘති 155 ක් නිම කිරීමට සැලසුම් කර තිබුණද නිමකර තිබුණේ ව්‍යාපෘති 97 ක් පමණි.

(ඈ) රු.මිලියන 1.2 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් සහිතව දේශීය සංචාරක සංවිධාන සමඟ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ දැනුවත් කිරීමේ ව්‍යාපෘති 15 ක් සහ රු.මිලියන 5 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් සහිතව වසර පුරා ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ මානව සම්පත් සංවර්ධනය උදෙසා වූ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

කාර්යාංශය විසින් 2016 ඔක්තෝබර් 31 දින සිට 2016 නොවැම්බර් 02 දින දක්වා ප්‍රංශයේ සංචාරක නියෝජිත ජාතික සංගමයේ වාර්ෂික මහා සම්මේලනය ශ්‍රී ලංකාවේ පැවැත්වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල වූ රු. 95,000,000 න් රු.51,000,000 ක් ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයෙන් දැරීමට අනුමැතිය ලබාදී තිබුණි.

උක්ත සම්මේලනයට අදාළව විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සහභාගී වන විදේශිකයන් සංඛ්‍යාව 300 ක් බව ප්‍රංශයේ සංචාරක නියෝජිත ජාතික සංගමයේ ලේකම්ගේ 2016 ජුනි 06 දිනැති විද්‍යුත් තැපැල මඟින් සනාථ කර තිබියදී 2016 සැප්තැම්බර් 15 දිනැති අංක MTD& CRA/2016/23 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව සහභාගි වන විදේශිකයන් සංඛ්‍යාව 488 ක් ලෙස ඇතුළත්කර වැය ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණි. මෙහිදී සත්‍ය වශයෙන් විදේශිකයින් සහභාගී වී තිබුණේ 286 දෙනෙකු පමණි.

(ආ) ඉහත සම්මේලෙනය පැවැත්වීම වෙනුවෙන් කොළඹ තරු පහේ හෝටල්වලින් වෙන් වෙන්ව මිල ගණන් ලබා ගැනීම වෙනුවට, හෝටල්කරුවන්ගේ සංගමයේ සභාපතිගෙන් මිල ගණන් ලබා ගෙන තිබුණි. එම මිල ගණන් සංචාරක සංවර්ධන අධිකාරියේ ගැසට් පත්‍රය පාදක කරගත් මිලක් බව අනාවරණය විය. 2011 මාර්තු 17 දාතමින් අංක 1697/24 දරන ගැසට් නිවේදනයට අනුව විවේක / රැස්වීම්/ දිරිගැන්වීම්/සම්මන්ත්‍රණ/ප්‍රදර්ශන (MICE) සඳහා ඉන්වොයිස් කළ මිලෙන් සියයට 10ක් අඩුකළ යුතු අතර එසේ අඩු නොකිරීම නිසා හෝටල් 4 ක් සඳහා රු.740,306 ක් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 සැප්තැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාල ඇමුණුම පරිදි හෝටල් කාමර සඳහා බදු සමඟ ගෙවීමට එකඟ වී තිබුණ මුදල තනි කාමර සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 169 ක් සහ ද්විත්ව කාමර සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 180 ක් වුවත්, ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 169.78 සිට 188.93 දක්වා ගෙවීම්කර තිබීම හේතුවෙන් හෝටල් 4 සඳහා රු.329,592 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) සම්මේලනය පැවැත්වීම වෙනුවෙන් ප්‍රංශ සංචාරක නියෝජිත ජාතික සංගමයෙන් අයකළ යුතු මුදල්වලින් ගුවන් ගමන් ගාස්තු වෙනුවෙන් රු.4,029,000 ක් අඩු කර තිබුණ ද එය අඩුකිරීමට හේතු හා එය තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

සමාලෝචිත වර්ෂයේදී අරමුදල් කළමනාකරණ ගිණුමේ රු.110,000,000 ක පමණ සාමාන්‍ය මුදල් ශේෂයක් පැවතියදී එය ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කර ඉහළ පොලී ආදායමක් ලබාගැනීමට කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනයේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව මූලික සුදුසුකම් සපුරා නොමැති හා ව්‍යාජ තොරතුරු ඇතුළත්කර ඉදිරිපත් කර තිබූ අයදුම්පත්‍රයක් පදනම් කරගෙන සාමාන්‍යාධිකාරීවරයෙක් බඳවා ගෙන 2016 දෙසැම්බර් සිට 2017 ජනවාරි දක්වා කාලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.483,372ක මුදලක් ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් 2016 මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2017 අප්‍රේල් 04 දින වූයෙන් දින 34 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 හි අවශ්‍යතාවයන්ට අනුව ආසන්න වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල හා උපායමාර්ගික සැලසුම් සමාලෝචනය කර කළමනාකරණයේ වගකීම ක්‍රියාකාරී සැලැස්මෙන් පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයට සහ සැලසුම් කරන ලද කාලයට අදාළව ළඟාකරගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ඉටුවන අයුරින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

කාර්යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ ගනුදෙනු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් හෝ පරීක්ෂාවට ලක් කර නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

සමලෝචිත වර්ෂයේදී ගිණුම් විෂයයන් 21 ක අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 29 සිට සියයට 433 ක් දක්වා පරාසයක විචලතාවයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට සංසන්දනාත්මකව තොරතුරු ඉදිරිපත් නොකිරීම. |
| (ආ) තොග පාලනය | ප්‍රවර්ධන තොගයට අදාළ සියළුම අයිතම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම. |